# ශ්‍රී ලාංකීය මහජන මතය හැඩගැස්වීමෙහිලා ජනමාධ්‍යයේ බලපෑම

ආර්. එම්. රිඩ්[6]

## සංක්ෂේපය

මානව නිදහස සහ සංවර්ධනය සැබෑ වශයෙන්ම අර්ථවත් වන්නේ සෑම කලකදීම රාජ්‍යයක ජනතාව භුක්ති විඳින්නාවූ නිදහස් අදහස් ප්‍රකාශනය මතය. මෙම නිදහස් අදහස් ප්‍රකාශනයේදී ඉතා අගනා කාර්යයක් ජනමාධ්‍ය විසින් ඉටු කරනු ලබයි. මේ නිසා විවිධ කරුණු පිළිබඳව ජනතාවගේ මතයන් වෙනස් කිරීමට ද, හැකියාවක් ජනමාධ්‍යයන්ට අද වන විට ලැබී තිබේ. විශේෂයෙන්ම දේශපාලනය, අධ්‍යාපනය, සෞඛ්‍යයට අදාළ සිද්ධීන් හා අවස්ථා පිළිබඳව දීර්ඝකාලීනී වශයෙන් ජනමාධ්‍යයන්ගේ අවධානය යොමු කිරීම තුළින් එම ක්ෂේත්‍ර තුළ විශාල වෙනසක් සිදු කිරීමට අවස්ථාව ලැබී තිබේ. ජනමාධ්‍ය තුළින් එක් එක් පුද්ගලයා කෙරෙහි ඇතිවන බලපෑම ආරම්භයේදී සුළු මට්ටමක පැවතිය ද, දීර්ඝකාලීනී ව විශාල පිරිසකට එම බලපෑම ක්‍රියාත්මක වේ. මෙහිදී යම් මතයක් විදහා පාමින් යම් කරුණක් පිළිබඳ ජනමාධ්‍ය තුළ නිරන්තරයෙන් අවධානය යොමු කිරීම හේතුවෙන් එයට යොමුවන පුද්ගලයින්ගේ මතවාද හා අර්ථ නිරූපණයන් ද, වෙනස්කම් වලට බඳුන් වේ. ඒ අනුව, අද වන විට යහපත් දේශපාලන සංස්කෘතියක අවශ්‍යතාව පිළිබඳ මතවාදයක් ජනමාධ්‍ය විසින් ශ්‍රී ලාංකීය පුරවැසියන් තුළ ගොඩනගා තිබේ. එනයින් ලංකාවේ පවතින දේශපාලන සන්දර්භය තුළ යහපත් දේශපාලන සංස්කෘතියක් පිළිබඳ මතය ගොඩනැගීම හරහා වර්තමාන දේශපාලන ක්ෂේත්‍රයට ජනමාධ්‍ය මඟින් එල්ලවන බලපෑම විමසා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ වී ඇත. අධ්‍යයනයට අවශ්‍ය තොරතුරු සපයා ගැනීම ද්විතියික තොරතුරු මූලාශ්‍ර මත පදනම් විය. එහිදී, විශ්ලේෂණය සඳහා පාදක කරගනු ලැබුවේ විස්තරාත්මක ක්‍රමවේදය යි. අධ්‍යයනයේ නිගමනය වන්නේ, පාලකයින් ජනමාධ්‍ය විරෝධාකල්පී පිළිවෙතක් අනුගමනය කරමින් පුරවැසියන්ගේ තොරතුරු දැන ගැනීමේ අයිතිය සීමා කිරීමට උනන්දුවක් දක්වන බවයි. නමුත් කුමන මර්දනකාරී තත්ත්වයන් යටතේ වුව ද, නොසැලී සිටිමින් ජනතාව වෙත නිවැරදිවූත්, සත්‍යවූත් තොරතුරු සම්ප්‍රේෂණය කිරීමට ජනමාධ්‍ය දරන ප්‍රයත්නය විශිෂ්ටය යන්නයි.

**මුඛ්‍ය පදඃ** *ජනමාධ්‍ය, දේශපාලනය, පුරවැසියන්, මහජන මතය*

## හැඳින්වීම

ගතවූ ශතවර්ෂය තුළ ශ්‍රී ලාංකීය දේශපාලන සමාජය සුවිශේෂී පරිවර්තන රැසකට භාජනය වී ඇති අතර තවදුරටත් පරිවර්තනය වෙමින් පැවතම හඳුනා ගත හැකිය. මෙහිදී ජනමාධ්‍ය මෙකී දේශපාලන සමාජ පරිවර්තනයන්ට බෙහෙවින් ඉවහල් වී ඇත. විශේෂයෙන්ම නූතන සන්නිවේදන තාක්ෂණික මෙවලම් වලින් සන්නද්ධ ජනයා ප්‍රජාතන්ත්‍රවාදයෙන් බැහැර වූ කලහකාරී අරගලයන් හරහා පවත්නා රජයන් වෙනස් කිරීමේ ප්‍රවණතාව වෙනුවට නිහඬ විප්ලවයන් මඟින් පවත්නා රජයන් වෙනස් කිරීමේ ඓතිහාසික දේශපාලනික සංසිද්ධීන් ලොව පුරා දැකගත හැකිය. ශ්‍රී ලංකාව තුළ ද, 2015 ජනවාරි 08 පැවති ජනාධිපතිවරණ ප්‍රතිඵලය මෙයට කදිම නිදසුනකි. එහිදී, ජනමාධ්‍යයේ හැසිරීම අනුව සමාජයේ මතවාද පවා වෙනස් කිරීමට හැකියාවක් ජනමාධ්‍ය සතුය යන පාඩම පාලකයින්ට අවබෝධ විය. විශේෂයෙන්ම රටේ පාලකයින්ගේ අසාධාරණකම් හා දූෂණ පිළිබඳ තොරතුරු පුරවැසියන් පළමුව දැන ගන්නේ ජනමාධ්‍ය තුළින් වන නිසා ජනමාධ්‍ය පිළිබඳව දේශපාලඥයින් සිය අප්‍රසාදය පළ කිරීමට යොමු වන අතර තම දූෂණ හා වංචා සඟවා ගැනීම සඳහා ජනමාධ්‍යයන්ට විවිධ සීමා පනවමින් මාධ්‍ය මර්දනය කිරීමට ද, පෙළඹී ඇත. නමුත් කුමන

[6] ශාස්ත්‍රවේදී දේශපාලන විද්‍යා (විශේෂ) තෙවන වසර

මර්දනකාරී පසුබිම් තුළ වුව ද, පුරවැසියන් වෙනුවෙන් සත්‍යය ගවේෂණය අතහැර දැමීමට ජනමාධ්‍ය ද, සූදානම් නොවේ. කෙසේ වෙතත් වර්තමාන ලෝකය දෙස බලන විට මාධ්‍ය නිදහස නොමැති හෝ අඩු රටවල ආණ්ඩුව විසින් පුරවැසියන් හසුරුවනු ලැබීමක් දක්නට ඇති අතර මාධ්‍ය නිදහස තිබෙන රටවල පුරවැසියන් වඩා නිදහසක් භුක්ති විඳිමින් ආණ්ඩුව හැසිරවීමට පෙළඹීමත් දක්නට ලැබේ.

## ජනමාධ්‍ය හා ජනමතය

රාජ්‍යයක පවතින ආණ්ඩුව විසින් ක්‍රියාවට නංවන්නාවූ රාජ්‍ය ප්‍රතිපත්ති එහි ක්‍රියාකාරීත්වය හා දේශපාලනික වශයෙන් වැදගත් සිදුවීම් පිළිබඳව, දෙන ලද අවස්ථාවකදී ජනතාව ප්‍රකාශ කරනු ලබන අදහස්වල සාමාන්‍යකරණය වූ අදහස "ජනමතය" ලෙස හැඳින්වේ (සොයිසා, 2009: 539). අන්තර්ජාතික දේශපාලනය තුළ මෙන්ම ජාතික දේශපාලනය තුළ ද මහජන මතය අතිශය වැදගත් ක්‍රියා කලාපයක් ඉටු කරනු ලබයි. පුද්ගලයෙකුගේ මතය හැඩගැස්වීම කෙරෙහි පවුල, අධ්‍යාපනය, ආගමික සංවිධාන, සමාජ කණ්ඩායම්, ජනමාධ්‍ය යන සාධක බලපාන අතර ජනමාධ්‍ය සාධකය පුද්ගල මතය හැඩගැස්වීමෙහිලා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි (සොයිසා, 2009: 550). විශේෂයෙන්ම අදහස් ප්‍රකාශ කිරීමේ සහ පළ කිරීමේ නිදහස ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන රටවල ඉතා ඉහළින් ගරු කරන අයිතිවාසිකමකි. ඒ අනුව ජනමාධ්‍ය එකී නිදහස උපරිම භුක්ති විඳිමින් සමාජයේ විවිධ ක්ෂේත්‍රවලට අදාළ සිද්ධීන් පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයක් සිය ග්‍රාහකයින් වෙත ඉදිරිපත් කරමින් ඔවුන් තුළ ඒ පිළිබඳ යම් මතයක් ගොඩනැගීම සිදු කරනු ලබයි. ඒ අනුව ජනමාධ්‍ය යනු මිනිසාගේ ජීවිතයට අත්‍යවශ්‍ය දෙයක් බවත් ඒ ඔස්සේ ඉතා පුළුල් සමාජ කාර්යභාරයක් සිදුවන බවත් අවිවාදාත්මකය.

සන්නිවේදනය මිනිසා ශිෂ්ටාචාරගත වන්නට පටන්ගත් දා සහ ඊට පෙර සිටම විවිධාකාරයෙන් සංවර්ධනීය තත්ත්වයකට පත්වූ විෂයකි. මානව වංශකතාවේ නව සංධිස්ථානයක් සටහන් කරමින් ගෝලීයකරණය හරහා තාක්ෂණික දියුණුවේ හිණි පෙත්තටම අද විශ්වය පැමිණ ඇත. මෙම තාක්ෂණික දියුණුවත් සමගම සන්නිවේදන මාධ්‍ය ද, ප්‍රබල ලෙස දියුණුවූ ට පත්විය. 1948 දී හැරල් ඩී ලැස්වෙල් සන්නිවේදනය නිර්වචනය කලේ "යමෙක්, යම් කිසිවක්, කිසියම් නාලකාවකින්, යම් කෙනෙකුට, කිසියම් බලපෑමක් ඇති කිරීම සඳහා ප්‍රකාශ කරයි ද, එය සන්නිවේදනය නම් වේ. "යනුවෙනි. එසේම "සන්නිවේදනය යනු යම් තැනක නිර්මාණය වූ හෝ තෝරාගත් පණිවුඩයක් ඒ හා සමාන ලෙස තවත් තැනෙක ප්‍රතිනිර්මාණය කිරීමක්" ලෙස ක්ලෝඩ් ෂැනොන් හා වොරන් වීවර් 1949 දී නිර්වචනය කර ඇත (https://owndreamworld.files.wordpress.com).ඒ අනුව ඉතා විශාල පිරිසක් ආමන්ත්‍රණය කිරීම සඳහාත් මිනිසාට බාහිර පරිසරය තුළ සිදුවන නොයෙකුත් තොරතුරු දැන ගැනීම සඳහාත් ජනමාධ්‍ය නිර්මාණය වී ඇත. එහිදී ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් සහ පුරවැසියන් අතර තිබිය යුතු නිරන්තර කතිකාව මූලික වශයෙන්ම පැවැත්වෙන්නේ ජනමාධ්‍ය නමැති වේදිකාව උපයෝගී කර ගනිමිනි. මේ අනුව පුරවැසි සමාජය මෙහෙයවීම, පුරවැසි සමාජය දැනුවත් කිරීම, පුරවැසියන් හරහා සමාජය විමසිල්ලට භාජනය කිරීම යන පුළුල් වගකීම් සමුදාය ජනමාධ්‍ය සමඟ බැඳී පවතින අතර මෙම වගකීම් ඉටු කිරීමට අවශ්‍ය බලය ද, ජනතාව හරහා ජනමාධ්‍ය තුළ ඒකරාශී වී ඇත.

මුල් වකවානුවේදී ජනමාධ්‍යයේ වගකීම වූයේ සමාජයේ පැවැත්මට අදාළ තොරතුරු එක්රැස් කොට ඒවා මහජනයා වෙත බෙදා හැරීමය. එහිදී එය මිනිසාගේ ඉදිරි ගමනට අවශ්‍ය කොන්දේසියක් ලෙස දක්වා තිබිණි. දෙවැනි වකවානුව වන විට ජනමාධ්‍යයේ කාර්යභාරය වූයේ සත්‍ය හෙළිදරව් කිරීමය (https://www.dinamina.lk). විශේෂයෙන්ම සමාජයේ ආධිපත්‍ය දරන පාලකයින් හා වෙනත් ප්‍රබල කණ්ඩායම් විවිධ තොරතුරු හා සිද්ධි පාලිතයින්ගෙන් සඟවා තිබෙන පිළිවෙතක් අද මෙන්ම එදත් තිබිණි. මේ අනුව සත්‍ය හෙළිදරව් කිරීම සමාජ අවශ්‍යතාවක් බවට පත්වුණු අතර එකී කාර්යභාරය ජනමාධ්‍ය විසින් බාර ගන්නා ලදි. තව ද, සත්‍ය හෙළිදරව් කර ගැනීමෙන් නොනැවතී සත්‍ය සැඟවීමේ අරමුණ පිළිබඳ විමර්ශනය කරමින් ඒ පිළිබඳ සමාජය තුළ මතයක් ගොඩනැංවීම ද අද වන විට ජනමාධ්‍යයේ විෂය ක්ෂේත්‍රයට ඇතුළත්ව ඇත (විජේකෝන්, 2011: 35). ඒ අනුව ජනමත නිර්මාණයට ජනමාධ්‍ය අත්‍යවශ්‍ය වේ. ජනමත නිර්මාණය කරනු ලබන්නේ ජනමාධ්‍ය

මඟින් වන අතර ජනමත නිර්මාණය ජනමාධ්‍යයේ මෙහෙවරකි. නිදසුනක් ලෙස ශ්‍රී ලංකාවේ උතුරේ යුද්ධය පිළිබඳ රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය අතර එකඟතාවක් නොවීය. එහිදී රාජ්‍ය මාධ්‍ය යුද්ධයට පක්ෂපාතී වාර්තාකරණයක නියැලුණු අතර පෞද්ගලික මාධ්‍ය විවේචනශීලී විය. එහෙත් මානුෂික මෙහෙයුම යන ඒකමතික රාජ්‍ය මතවාදය ජනගත කිරීමට සමස්ත මාධ්‍ය පද්ධතියම කටයුතු කළ අතර ඒ හේතුකොටගෙන සමස්ත ලාංකික ජනතාවම එය යුද්ධයක් ලෙස නොව මානුෂිය මෙහෙයුමක් යන දෘෂ්ටියෙන් බලා එයට සහය පළ කළහ. ජනමාධ්‍ය මඟින් සිදුකළ හැකි සමාජ වෙනස පිළිබඳ තවත් උදාහරණ ලෙස 1994 අගෝස්තු මැතිවරණය හා 2015 ජනවාරි 08 ජනාධිපතිවරණය දැක්විය හැකිය. 1994 අගෝස්තු මැතිවරණය අවස්ථාව වන විට විකල්ප (ටැබ්ලොයිඩ්) පුවත්පත් දීර්ඝ කාලයක් තිස්සේ අවධානය යොමු කොට තිබුණු මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම් ඇතුළු සමාජ විරෝධී ක්‍රියාවන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස එම තත්ත්වය මැතිවරණ ප්‍රතිඵල කෙරෙහි ද, දැඩි ලෙස බලපෑවේය. 2015 ජනවාරි 08 මැතිවරණය වන විට රට තුළ ජනමාධ්‍ය නිදහස අතිශය සීමා වී තිබූ පසුබිමක් තුළ විපක්ෂයේ මතවාද පුරවැසියන් කරා ගෙන යාම අතිශය සංකීර්ණ විය. ඒ අනුව පොදු විපක්ෂය ෆේස්බුක්, ට්විටර් වැනි නව මාධ්‍ය හරහා වඩාත් පුරවැසියන් සමඟ කථාබහ කලේය. එහිදී නව මාධ්‍ය සමඟ නිතරම ගනුදෙනු කරන තරුණ පිරිස්වල සහය මත පාලනයේ වෙනසක් කිරීමට පොදු විපක්ෂයට හැකියාව උදා විය. ජනමතයක් ගොඩනැගීමට ජනමාධ්‍ය භූමිකාව අතිශය වැදගත් සාධකයක් බවට ශ්‍රී ලංකාව ආශ්‍රයෙන් මෑතකාලීනව දිය හැකි හොඳම සිදුවීම වන්නේ රතුපස්වල සිදුවීමයි. එහිදී රතුපස්වල වැලිවේරියේ ජනතාව රටක් රාජ්‍යයක් ඉල්ලුවේ නැත. ඔවුන් ඉල්ලුවේ පිරිසිදු ජලය පමණකි. එය ද, නොමැරී ඉන්නටය. නමුත් ඔවුනට පාලකයින්ගෙන් හිමි වූයේ වතුර වෙනුවට වෙඩි උණ්ඩය. එදා මේ බිහිසුණු සිදුවීම පිළිබඳ විපක්ෂය පවා හඬක් නොනගන විට රතුපස්වල සිදුවීම ජනතා මාතෘකාවක් බවට පත් කළේ සීමිත මාධ්‍ය ආයතන කිහිපයක් පමණි.

ජනමාධ්‍ය විසින් ජනමතය තීරණය කිරීමේ අන්තර්ජාතික උදාහරණයක් වශයෙන් ඇමරිකාව ඉරාකයට විරුද්ධව ගෙන ගිය සටන දැක්විය හැකිය. මක් නිසාදයත් අරාබි ලෝකය තුළ වීරයන් වූ සදාම් හුසේන් සහ ඔසාමා බින් ලාඩන් බටහිර රටවල බී.බී.සී, සී.එන්.එන් වැනි ජනමාධ්‍ය ඉදිරියේ ත්‍රස්තවාදීන් වීම හා අරාබි, අල්ජසීරා වැනි මාධ්‍ය ඉදිරියේ ඇමරිකානු හිටපු ජනාධිපති ජෝර්ජ් බුෂ් ත්‍රස්තවාදියෙකු ලෙසත් බටහිර මාධ්‍ය ඉදිරියේ ජෝර්ජ් බුෂ් වීරයෙකු වීම නිසාත් අද පවා අරාබි ජනතාව තුළ සදාම් හුසේන් වීරයෙකු ලෙස පිළිගැනීමත් බටහිර ජනතාව ජෝර්ජ් බුෂ් වීරයෙකු ලෙස පිළගැනීමත් දැකිය හැකිය.

මෙසේ වේගවත් සමාජ පරිණාමය හේතුකොටගෙන බිහිවන සංකීර්ණ සහ අවිනිශ්චිත ලෝකයට ජනතාව ජනමාධ්‍ය ඔස්සේ මාර්ගෝපදේශ ලබා ගැනීමට වැඩි වැඩියෙන් යොමු වී ඇති බව පර්යේෂකයෝ පෙන්වා දී ඇත. එසේම දේශපාලන පක්ෂයකට ඍජුව සම්බන්ධ නැති, දේශපාලනයට අඩු උනන්දුවක් දක්වන, ජනමාධ්‍ය තුළින් සාකච්ඡා කරන මාතෘකා ගැන තමන්ගේම මතයක් නොදරන පුද්ගලයින්ට ජනමාධ්‍ය මඟින් විශාල බලපෑමක් එල්ල කළ හැකි බව ද, ඔවුන් පෙන්වා දී ඇත.

## ජනමාධ්‍ය හා දේශපාලනය අතර පවතින සම්බන්ධතාව

ප්‍රජාතන්ත්‍රවාදය යනු ජනතාව විසින් ජනතාව උදෙසා ජනතාවගේ සහභාගීත්වයෙන් පවත්වාගෙන යනු ලබන පාලන ක්‍රමයක් නම් එකී පාලනයට ජනතා අදහස් එකතු වන්නේ හා පාලනය ජනතා අදහස් අනුව ගෙනයා හැකි වන්නේ ජනතාවගේ අදහස් ප්‍රකාශයට පත්වන හා පිළිඹිබු වන තරමටය. මෙහිදී විශේෂයෙන්ම ජනතා අදහස් පිළිඹිබු කිරීමේදී ජනමාධ්‍ය සතු කාර්යභාරය අති මහත්ය. ජනතාවගේ දුක්ගැනවිලි පාලකයින්ට ඉදිරිපත් කර ඔවුන්ගේ අවධානය ඒවා කෙරෙහි යොමු කරවීම හා එම ජනතාවගේ දුක්ගැනවිලිවලට සවන් නොදෙන හිතුවක්කාරී පාලකයින්ට එරෙහිව ජනතාව පෙළ ගැස්සවීමත් නූතන ජනමාධ්‍යයේ ප්‍රමුඛ කාර්යයක් බවට පත්ව ඇත (විජේකෝන්, 2011: 31). තව ද, පාලකයින් අතින් පුරවැසි අයිතිවාසිකම්වලට හා නිදහසට බාධා පැමිණෙන විට එයට එරෙහිව නැගී සිටීමට පුරවැසියන් නිර්භීතව ඉදිරිපත් නොවන විට එකී

පුරවැසියන්ගේ අයිතිවාසිකම් හා නිදහස වෙනුවෙන් ජනමාධ්‍ය තුළ පුළුල් කතිකාවතක් නිර්මාණය කොට අයිතිවාසිකම් හිමිකර දීම ද, හඳුනා ගත හැකිය.

ශ්‍රී ලංකාව තුළ මූලික නීතිය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් 'භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස' මූලික අයිතිවාසිකමක් ලෙස තහවුරු කර ඇති අතරම එහිම විවිධ සීමාවන් ගැන ද, සඳහන් කර තිබේ. බොහෝ අවස්ථාවලදී දේශපාලන බලය පවත්වා ගැනීම සඳහා පවතින ආණ්ඩු හා පාලකයින් බොහෝ විට මෙම නීතියේ සීමා ප්‍රයෝජනයට ගනිමින් ජනමාධ්‍යයට එරෙහිව ක්‍රියා කිරීමට පෙළඹේ. විශේෂයෙන්ම අපහාසය පිළිබඳ අපරාධ නීතිය ප්‍රයෝජනයට ගනිමින් පාලන තන්ත්‍රයේ දූෂණ වංචා ආදිය හෙළි කිරීම වැළැක්වීමට දේශපාලඥයින් කටයුතු කළ ද, "සත්‍ය වූ යමක් මහජන යහපත උදෙසා ප්‍රසිද්ධ කළ හැකිය" යන නෛතික අවශ්‍යතාව මත හිඳිමින් එඩිතරව සිය වගකීම් ඉටු කිරීමට ඇතැම් මාධ්‍ය ආයතන කටයුතු කිරීම ප්‍රශංසනීය ය.

වර්තමානයට සාපේක්ෂව අතීතයේදී සිදුවූයේ ජනමාධ්‍ය විසින් දේශපාලඥයින්ගේ අවශ්‍යතා ජනතාවට යොමු කිරීමේ කාර්යය යි. එනම් දේශපාලඥයින් විසින් එවනු ලබන සංදේශ ජනතාව වෙත පැටවීමයි. එහිදී ජනතාව එයට දක්වන නියම ප්‍රතිචාරය එළි දැක්වීමක් සිදු නොවීය. නමුත් අද වන විට මෙකී තත්ත්වය අභිබවා ගොස් පාලකයින්ගේ ප්‍රතිපත්ති හා තීරණ වලට ජනතාවගේ ප්‍රතිචාරය හැඩගැස්වීම හා එළිදැක්වීම තුළින් ජනතා අයිතිවාසිකම්වල මුර බල්ලන් බවට ජනමාධ්‍ය පත්ව ඇත (ජයසේකර, 1998, 190). එමනිසා බලයට පත්වන සෑම ආණ්ඩුවක්ම උත්සාහ කරන්නේ ජනමාධ්‍ය මර්දනය කිරීමටය. නමුත් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක සිදුවිය යුත්තේ ජනමාධ්‍ය මර්දනය නොව වර්ධනය බව ඉන්දියාවේ ප්‍රථම අගමැති ජවහර්ලාල් නේරු පවසා ඇත්තේ මෙසේය. "මාධ්‍ය නිදහස වැරදි ආකාරයට යොදා ගැනීමේ අනතුරුදායක බව තිබියදීත් මා වඩාත් කැමති වන්නේ පාලනය කළ හෝ පීඩනයට පත් කළ හෝ මාධ්‍යයකට නොව මුළුමනින්ම නිදහස් මාධ්‍යයකටය". බලයට ඒමට පෙර මාධ්‍ය නිදහස නැතැයි විවිධ ස්ථානවල මාධ්‍ය සංදර්ශන පවත්වන අප රටේ සෑම පක්ෂයක්ම බලයට පැමිණි පසු තොරතුරු දැන ගැනීමේ නිදහස ඇහිරීමට පටන් ගනියි. නමුත් සත්‍ය දැන ගැනීමේ අයිතිය වෙනුවෙන් මාධ්‍යවේදීන් ඉතා අතලොස්සක් නිර්භීතව කරගෙන යන වෑයම නිසාම දේශපාලඥයින්ගේ මැර බලයට වඩා මාධ්‍යවේදීන්ගේ පෑන ඉතා බලවත් වී ඇත. ඒ නිසාම ලංකාවේ රජුන් තනන්නන් හා රජුන් නසන්නන් අතර අන්තර් සම්බන්ධය ජනමාධ්‍ය බව පාලකයින්ට වැටහීයන කාලය වැඩි ඈතක නොවනු ඇත. මන්දයත් අතීතය විමසීමේදී පෙනීයන්නේ බලවත් රජයක් හා ස්වාධීන මාධ්‍ය අතර ගැටුමකදී බලපෑම් හා පීඩා කළ හැකි යාන්ත්‍රණ රැසක් රජය සතු නිසා නිරන්තරයෙන්ම පාහේ මුල් වට කිහිපය ජය ගන්නේ රජය නමුත් අන්තිමේදී ස්වාධීන මාධ්‍ය ජය ලබන බවයි.

මහාචාර්ය විල්බර්ශ්‍රාම් මාධ්‍යයේ වගකීම පිළිබඳව කතා කරමින් සැබෑ මාධ්‍යයන් භූමිකා 3ක් රඟ දැක්විය යුතු බව ප්‍රකාශ කරයි. ඒ අනුව දේශපාලන සමාජය තුළ ද, එකී භූමිකා රඟ දැක්වීම ජනමාධ්‍යයේ ප්‍රමුඛ කාර්යභාරයකි (වීරකෝන්, 2006: 133). එම භූමිකා පිළිබඳ විග්‍රහා කිරීමේදී, එක් ආකාරයකින් ජනමාධ්‍ය ගුරුවරයෙකු ලෙස කටයුතු කළ යුතු බව දක්වයි. ඒ අනුව, ජනමාධ්‍ය තමා වටා නිරන්තරයෙන් ම, ගෝලයින් රැසක් සිටිමින් තමා අනුගමනය කිරීමට පෙළඹෙන බැවින් ගුරුවරයා සෑම විටම ආදර්ශමත්ව කටයුතු කිරීමට පෙළඹේ. ඒ අනුව ගුරුවරයා හෙවත් ජනමාධ්‍ය යමක් පවසන්නේ ද, එය එයාකාරයෙන්ම ගෝලයෝ හෙවත් පුරවැසියෝ පිළිගනිති. ඒ අනුව සෑම විටම අසත්‍ය වෙනුවට සම්පූර්ණ සත්‍ය පමණක් පුරවැසියන්ට ඉදිරිපත් කරමින් යහපත් දේශපාලන සමාජයක් බිහිකිරීමට ජනමාධ්‍යයට සිදුවේ. එසේම, ජනමාධ්‍ය ආරක්ෂකයෙකු හෙවත් මුරකරුවෙකු ලෙස ක්‍රියා කළ යුතු බව දක්වයි. එහිදී සමාජය තුළ පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, මහජන නියෝජිතයන් මහජනතාවගේ අභිලාෂ ඉටු කරමින් තම වගකීම ඉටු කරන්නේ ද යන්න පරීක්ෂාකාරීව සිටීමේ වගකීම ජනමාධටට වෙත පැවරී ඇත. එමෙන් ම, ජනමාධ්‍ය සාකච්ඡා මණ්ඩපයක් ලෙස ක්‍රියා කළ යුතු බව දක්වයි. දේශපාලනික වශයෙන් රට යන මාවත හා යා යුතු මාර්ගය නිවැරදිව සකස් වී ඇත්තේ ද' යන්න සමාජය තුළින්ම විමසා බැලීම මෙහිදී ජනමාධ්‍ය විසින් සිදු කරනු ලබයි.

මෙසේ ජනමාධ්‍ය මඟින් කෙරෙන නිරූපිතයන් ඇතුළු අන්තර්ගතයට දේශපාලන සත්ත්වයින් ලෙස ග්‍රාහකයෝ දැඩි අවධානය යොමු කරති. එතෙකින් නොනැවතී එම අන්තර්ගතය පිළිබඳව මිතුරන්

හා හිතවතුන් සමග සංවාදයේ යෙදෙති. එසේම තමන් දන්නා හඳුනන සෙසු අයට ද, එම තොරතුරු සපයති. එමනිසා එම අදහස් පුළුල්ව ව්‍යාප්ත වේ. මේ අනුව පෙනී යන්නේ ජනමාධ්‍ය තුළින් දේශපාලනය පිළිබඳ අපගේ අර්ථ නිරූපනයන්ට දැඩි බලපෑමක් එල්ල වන බවයි. ඒ අනුව, මෙම තත්ත්වය නිසා මාධ්‍ය මඟින් නිරූපිත යථාර්ථය විසින් අපගේ දේශපාලන අදහස්වලට වක්‍රව දැඩි බලපෑමක් එල්ල වේ. එම නිසා ජනමාධ්‍ය සතු බලය හේතුකොටගෙන එමඟින් සමාජයට එල්ල කරන බලපෑම තුළින් දේශපාලන ක්ෂේත්‍රය තුළ මාධ්‍යයේ බලපෑම අනිවාර්යයෙන්ම ජනිත වී ඇත.

## දේශපාලනයට ජනමාධ්‍යයේ හා ජනමාධ්‍යයට දේශපාලනයේ ඇති බලපෑම

ශ්‍රී ලංකාව තුළ දේශපාලනය හා ජනමාධ්‍ය අතර සම්බන්ධයට දිගු ඉතිහාසයක් තිබේ. මෙනිසා ජනමාධ්‍ය මඟින් පාලකයින්ට එල්ල කරන බලපෑමේ ප්‍රවණතාව ද, වර්ධනය වෙමින් පවතී. එහිදී ජනමාධ්‍ය සමාජයේ සියලු පුද්ගල වුවමනා තීරණය කරමින් ඒවා ඉටු කිරීමට පාලකයින් පෙළඹවීම දක්වා වර්ධනය වී ඇත. එසේම ඒ සඳහා පාලකයින්ගේ ප්‍රතිචාරය මත පාලකයින් පිළිබඳ පුරවැසියන්ගේ මානසිකත්වයට සෘජුවම බලපෑම් කිරීමට තරම් ජනමාධ්‍ය ප්‍රබල වී ඇත. දේශපාලනයේ නැතහොත් රාජ්‍ය පාලනයේ දුර්වලතා නිසා ඇතිවන තත්ත්වයන් දේශපාලන බල අධිකාරිය නොසැලකිලිමත් වීම වැනි කරුණු තුළ එකී කාර්යයන් ජනමාධ්‍ය ආයතන මඟින් ඉටු කිරීම දැක ගත හැකිය. එවැනි අවස්ථා තුළ කියන්නට කෙනෙක් නැති අසන්නට අයෙක් නැති ජනතාවගේ අසරණකමට ක්ෂණික ප්‍රතිචාර දැක්වීමේ හැකියාව ජනමාධ්‍ය සතුය යන්න ඔප්පු කරමින් ජනමාධ්‍ය රටක පාලකයින් ද, අභිබවා යන තත්ත්වයකට පත් වෙමින් ජනතාවගේ දේශපාලන මතවාදවලට ආමන්ත්‍රණය කරයි. මෙයට කදිම නිදසුනක් ලෙස පෙන්වා දිය හැක්කේ 2016 වසර මැද භාගයේ පමණ මුළු කොළඹ දිස්ත්‍රික්කයම යට කරමින් ගලා ගිය මහා ගංවතුර ආපදාවයි. එම ආපදා අවස්ථාවේදී රටේ පාලන අධිකාරිය මුදල් ප්‍රතිපාදන, චක්‍රලේඛ මත සිර වී ක්ෂණික ප්‍රතිචාර දැක්වීමට නොහැකිව සිටින විට මේ රටේ මාධ්‍ය ආයතන විපතට පත් වූවන්ට සහන සැලසීමට ඉදිරිපත් නොවන්නට පාලන අධිකාරියේ නොහැකියාව ලොවටම හෙළිදරව් වනු නොඅනුමානය. ඒ අනුව මෙකී තත්ත්වයන් තුළ පුරවැසියන් පාලන අධිකාරිය මත වෙනුවට ජනමාධ්‍ය මත විශ්වාසය තබා තිබීමේ ප්‍රතිඵලය ලෙස අද වන විට ජනමාධ්‍ය ආයතන පාලන අධිකාරියට දැඩි බලපෑම් එල්ල කිරීම දැකගත හැකිය. තව ද, මූලික අයිතිවාසිකම් පිළිබඳව ශ්‍රී ලංකාවේ අද පවතින උනන්දුවත් මුඛ්‍ය ලෙසම ජනමාධ්‍ය නිසාම ඇති වූ දෙයක් බව පැහැදිලිය. ඇත ගම්බද ජනතාව පවා තමන්ට අසාධාරණ පොලිස් අතවරවලට බඳුන් වීමට සිදුවූ අවස්ථාවල අධිකරණයේ පිහිට පැතීම වැනි අවස්ථා තුළින් කියා පාන්නේ ජනමාධ්‍ය විසින් සමාජය තුළ සිදු කොට ඇති සහ සිදු කෙරෙමින් පවතින සාධනීය සමාජ බලපෑමයි.

මැතිවරණවලදී ජනමාධ්‍යයන්හි බලපෑම පිළිබඳව ඇමරිකා එක්සත් ජනපදයේ ලැසා(ර්) ෆෙල්ඩ් ඇතුළු පිරිස එදා කළ අධ්‍යනයකදී පෙනී ගියේ ජනමාධ්‍යයන්ට කළ හැකි වූයේ, ඡන්දදායකයින් අදහස් කළ පරිදිම ඡන්දය පාවිච්චි කිරීමට ඔවුන්ව යොමු කිරීම පමණක් බවයි. පූර්ව නිශ්චිත අවසානයක් කරා යාමට මඟ පෙන්වන සලකුණුවල කාර්යය පමණක් ජනමාධ්‍ය තුළින් ඉටු වූ බව එම අධ්‍යයනයේදී අවධාරණය කෙරුණු අතර එනිසා ඔවුන්ගේ නිගමනය වූයේ මාධ්‍යයන්හි බලපෑම සීමිත එකක් බවයි. එහෙත් පසුගිය කාලය තිස්සේ කරන ලද විවිධ අධ්‍යනයන්ගෙන් හෙළි වී ඇත්තේ වෙනස්ම චිත්‍රයකි. එනම් ජනමාධ්‍යයන්ට ඡන්දදායකයින් සුළු පිරිසකගේ තීරණ වෙනස් කිරීමට හෝ ඡන්දය දීමෙන් වැලකී සිටීමට හෝ පෙළඹවීමට හැකියාවක් ඇති බවයි (කරුණානායක, 2004: 184-186). මෙහිදී ජනමාධ්‍යයන්ගේ පැහැදිලි කාර්යභාරය නම් ඡන්දදායකයින්ගේ පූර්ව විශ්වාස හා නිගමනවලට අනුකූල ලෙස මැතිවරණයකදී ක්‍රියා කිරීමට ඔවුන්ට ජනමාධ්‍ය තුළින් පිටිවහලක් ලබා දීමයි. එහිදී ජනමාධ්‍ය මඟින් මැතිවරණයකට ලබාදෙන අවධානයේ ප්‍රමාණය වැඩිවන විට ඡන්දය දෙන සංඛ්‍යාව ද, වැඩිවීමට එය හේතුවන බව ඇමරිකා එක්සත් ජනපදය සිදුකළ අධ්‍යයනවලින් පෙන්වා දී ඇත.

ඒ අනුව වර්තමානය වන විට ඕනෑම මැතිවරණයකදී මාධ්‍ය විසින් කෙරෙන ඉදිරිපත්කිරීම් ජයග්‍රහණය සඳහා විශාල වශයෙන් බලපායි. පසුගිය කාලය තුළ ශ්‍රී ලංකාවේ පැවති විවිධ මැතිවරණවලදී කැපී පෙනුණු ලක්ෂණය නම් ජනමාධ්‍ය හරහා විවිධ පණිවුඩ තුළින් විශේෂයෙන්ම

පුවත්පත්, ගුවන් විදුලිය හා රූපවාහිනී දැන්වීම් ඔස්සේ සිය ඉලක්කගත ඡන්දදායකයින් ඇමතූ අපේක්ෂකයින්ට සෙසු අපේක්ෂකයින්ට වඩා සාපේක්ෂව වැඩි වාසි අත් වූ බවයි. ඒ අනුව ජනමාධ්‍ය දියුණු වී ඇති අද දවසේ විශාල මුදලක් ප්‍රචාරණය වෙනුවෙන් වැය කළ නොහැකි අපේක්ෂකයෙකුට ජනතා වරමක් ලබා ගැනීම අතිශයින්ම දුෂ්කර කටයුත්තක් වී ඇත.

එසේම පක්ෂ මාරු කරන දේශපාලකයින්ගේ එදා මෙදා කතා, පාලක පක්ෂයේ හා විපක්ෂයේ කයිවාරුව හා කෙරුවාව අතර පරතරය, මෙසේ පාලකයින් කවුරුත් රැවටීමට තැත් කරන අහිංසක ඡන්දදායකයින්ගේ සිහනි හා අපේක්ෂා, අන්තවාදයට එරෙහිව කෙරෙන සමාජ ප්‍රතිවිරෝධය ආදිය නිමිති කර ගනිමින් ෆේස්බුක්, ට්විටර්, යූ ටියුබ් ආදී සමාජ මාධ්‍ය ජාල හරහා දේශපාලන පක්ෂ විචාරයට හා අභියෝගයට ලක් කරන ව්‍යක්ත හා හාස්‍යජනක නිර්මාණ ජනතාවට බෙදා හැරීම තුළින්ද ජනමතය හැඩගස්වා දේශපාලනයට අභියෝග එල්ල කිරීමට ජනමාධ්‍යයට හැකි වී ඇත. කෙසේ වෙතත් ජනමාධ්‍ය මගින් සමාජය තුළ පවතින ආර්ථික, දේශපාලනික, සමාජ ගැටලු පිළිබඳව නිරන්තරයෙන්ම කරුණු දැක්වීම නිසා ජනතා විශ්වාස හා ආකල්පවල වෙනසක් ඇතිවීම නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් හා බලධාරීහු අදාළ අවස්ථාවන්ට විසඳුම් සෙවීම සඳහා පෙරට වඩා උත්සුක වී ඇත (https://sithuwililokaya. blogspot.com).

මෙසේ ජනමාධ්‍ය විසින් පාලකයින්ට එල්ල කරන පීඩනය වැඩි වීමත් සමඟම පාලකයින් ද, විවිධ ක්‍රමවේද ඔස්සේ මාධ්‍ය මර්ධනය කරමින් ජනමාධ්‍යයන්ට බලපෑම් කිරීමට පටන් ගෙන ඇත. ලෙනාඩ් ආර්. සස්මන් ලියූ 'ංසළු එයැ ජැබිදර, ැබඑැර එයැ රුටමක්එදර' නැමැති ලිපිය තුළ ලෝකයේ පාලකයින් හා ඔවුන්ගේ අනුගාමිකයින් විසින් මාධ්‍ය සඳහා යොදා ගන්නා මර්ධන විධික්‍රම කිහිපයක් පිළිබඳව කරුණු රැසක් අනාවරණය කොට ඇත (රාජපක්ෂ, 1998, 141). සෑම රටකම පාහේ මාධ්‍ය මර්ධනයේ දී, ඒවා යොදාගන්නා බවත් පොදු ලක්ෂණ ඇති බවත් පෙනෙන අතර ලංකාවේ ද, මේ සඳහා උදාහරණ රැසක් පෙන්වා දිය හැකිය. 1970-1977 කාලයේදී ලේක්හවුස් ආයතනයට ගිනි තැබීම, දවස ආයතනයට ගිනි තැබීම, 1977-1994 කාලය තුළදී ලක්දිව, හිරු, රාවය, ඇත්ත වැනි පුවත්පත් ආයතනවලට රාජ්‍ය බලධාරීන් කඩා වැදීම, මාධ්‍යවේදී ප්‍රේමකීර්ති ද. අල්විස් ඝාතනය, මාධ්‍යවේදී රිචඩ්. ද. සොයිසා ඝාතනය, දිවයින පුවත්පතේ ඡායාරූප ශිල්පී විමල් එස්. සුරේන්ද්‍ර ඝාතනය, ඇත්ත කාටුන් ශිල්පී යුනුස්ට පහරදී පිහියෙන් ඇනීම, දිවයින පුවත්පතේ ධර්මරත්න විජේසුන්දරට පහරදීම, සටන කර්තෘ රෝහණ කුමාර නාඳුනන තුවක්කුකරුවෙකුට බිලිවීම, රිවිර කර්තෘ උපාලි තෙන්නකෝන් හා ද නේෂන් නියෝජ්‍ය කර්තෘ කීත් නොයෙල් මැර ප්‍රහාරයන්ට ලක්වීම, සන්ඩේ ලීඩර් කර්තෘ ලසන්ත වික්‍රමතුංග ඝාතනය, මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදහන්වීම, ස්වාධීන රූපවාහිනියේ හා ජාතික රූපවාහිනියේ මාධ්‍යවේදීන්ට පහරදීම, සන්ඩේ ලීඩර්, උදයන් හා සිරස වැනි ජනමාධ්‍ය ආයතන ගිනි තැබීම, මාධ්‍යවේදී ෆ්‍රෙඩී ගමගේට පහරදීම යනාදිය ඉන් කිහිපයක් පමණි. මෙසේ පාලකයින් අත්තනෝමතිකව කටයුතු කරන විට ඔවුන්ව අත්තනෝමතික භාවයෙන් මුදවාගෙන මහජනතාවට වගකියන පුද්ගලයින් බවට පත් කිරීම සඳහා අදහස් ප්‍රකාශ කිරීම පිළිබඳ අයිතියේ තවත් අතුරු අයිතියක් ලෙස ආණ්ඩුව විවේචනය කිරීමට ඇති අයිතිය භාවිත කිරීම නිසා මෙකී ජනමාධ්‍ය ආයතන සහ ජනමාධ්‍යවේදීන්ට වන්දි ගෙවීමට සිදු විය. නමුත් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ජනමාධ්‍ය සම්බන්ධයෙන් පාලකයින්ගේ වගකීම විය යුත්තේ ජනමාධ්‍යයන්ගේ විවේචන මැදිහත්බවින් හා සතුටින් පිළිගෙන අවශ්‍ය නම් තමන් වෙත එල්ල වූ විවේචන වෙත ප්‍රතිවිවේචනයක් එල්ල කිරීම මිස හිංසනය හෝ ඊට එරෙහි ආයුධයක් කර ගැනීම නොවේ.

## නිගමනය

සමස්තයක් ලෙස ගත්විට රටක් තුළ ජනමාධ්‍යයන්ට විශාල වගකීම් සමුදායක් හා තීරණාත්මක කාර්යභාරයක් පැවරී ඇත. ඒ තුළ ඉතාම වැදගත් සහ ප්‍රමුඛ වන්නේ රට තුළ සිදුවන සිදුවීම් නිවැරදිව හා නිරවුල්ව වාර්තා කිරීමයි. සිදුවූයේ කුමක් ද, සිදුවෙමින් පවතින්නේ කුමක් ද, යන්න සරලව රටවැසියාට තේරුම් කර දීමයි. එනම් ජනමාධ්‍යට කළ හැකි ලොකුම මෙහෙවර සැවොම කරන කියන දේ උපරිම ලෙස සමාජගත කිරීමයි. කෙසේ වෙතත් ජනමාධ්‍ය මගින් දේශපාලනික වශයෙන් ජනතාවගේ බුද්ධිය පුළුල් කිරීම කරණකොටගෙන අද වන විට සියුම් ලෙස පවා මහජන මතයට බලපෑම් කිරීමට ජනමාධ්‍යයට හැකියාව උදාවී ඇත. මෙසේ කුමන මර්දනකාරී තත්ත්වයන්

යටතේ වුව ද, නිදහස අරබයා ජනමාධ්‍ය විසින් ගෙන යනු ලබන දැඩි අධිෂ්ඨාන පූර්වක අරගලය හේතුකොටගෙන ශ්‍රී ලාංකීය දේශපාලනය තුළ මහජන මතය හැඩගැස්වීමෙහිලා මෙන් ම, එය ප්‍රකට කිරීමෙහිලා ද, වැදගත් කාර්යභාරයක් ජනමාධ්‍ය අතින් ඉටුවන බව අවිවාදාත්මකය.

## ආශ්‍රිත ග්‍රන්ථ


කරුණානායක, එන්., 1999. *මාධ්‍ය ප්‍රතිචාර*, කොළඹ: සමාජය සහ සාමයික කේන්ද්‍රය. කරුණානායක,

එන්., 2004. *ජන සන්නිවේදනය 2* , නුගේගොඩ: සමන් ප්‍රකාශකයෝ.

නානායක්කාර, එස්., 2012. *සංවර්ධනාත්මක සන්නිවේදනය*, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

පෙරේරා, කේ. ඇස්., 1998. *පුවත්පත් කලා සමීක්ෂා II*, කොළඹ: ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය.

රාජපක්ෂ, ඩබ්., 2000. *මාධ්‍ය නිදහස සහ වගකීම*, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.

විජේකෝන්, සී., 2011. *ජනමාධ්‍ය හා සමාජ විඥානය*, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

වීරකෝන්, අයි., 2006. *රූපවාහිනී ප්‍රවෘත්තිකරණය* , කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

https://sithuwililokaya. blogspot.com


.